# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


**අංක 1920/34 – 2015 ජුනි මස 26 වැනි සිකුරාදා – 2015.06.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය මුනසිංහ කාරියවසම් අප්පුහාමිලාගේ දොන් සෝමදාස ගුණවර්ධන වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩුගොඩ උඩසිය පත්තුව සුලු කොට්ඨාසයේ, මොරගස්පිටිය (අ.ග.පි. 33 තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක Ma/PLL/2013/360 හා 2014.04.24 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.1034 ක් පමණ වූ මහවත්ත නමැති ඉඩම් කැබල්ලට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – මහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.1034 ක් පමණ

උතුරට: මෙම ඉඩමේ ඉතිරි කොටස සහ හෝමාපොල ගම; නැගෙනහිරට: හෝමාපොල ගම (අ.ග.පි.42); දකුණට: මෙම ඉඩමේ ඉතිරි කොටස සහ මාර්ග (ප්‍රා.ස.); බටහිරට: මාර්ග (ප්‍රා.ස.) සහ මෙම ඉඩමේ ඉතිරි කොටස.

එම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන,<br>ඉඩම් අමාත්‍ය.

මගේ අංකය : 4-3/9/2013/ඩබ්ලිව්එස්/473.<br>ඉඩම් අමාත්‍යාංශය,<br>'මිහිකත මැදුර',<br>රජමල්වත්ත පාර,<br>බත්තරමුල්ල.<br>2015 මැයි මස 13 වැනි දින.

07 – 561